# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2412/42 - 2024 නොවැම්බර් මස 30 වැනි සෙනසුරාදා - 2024.11.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2019/350.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.03.29 දිනැති හා අංක 2273/19 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.03.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාලඹේ, තලාහේන, හල්බරාව පාර, 3 වැනි පටුමග, අංක 494/ඊ හි පදිංචි එන්. පී. මදරසිංහ මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොලොන්නාව, නිමාව හි පිහිටි සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.12.28 දිනැති A14/2022 ප්‍රදානය පළ කරනු ලැබූ 2024.03.12 දිනැති හා අංක 2375/17 දරන ගැසට් නිවේදනයේ දෝෂ නිවැරදි කිරීම සඳහා 2024.10.29 දිනැති සංශෝධිත ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2014 නොවැම්බර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**2024 මාර්තු මස 12 වැනි දින 2375/17 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයේ දෝෂ නිවැරදි කිරීම.**

යොමු අංකය : IR/COM/02/2019/350
නඩු අංකය : A/14/2022

එන්. පී. මදරසිංහ මිය
අංක 494/ඊ,
3 වන පටුමග,
හල්බරාව පාර,
තලාහේන,
මාලඹේ.

*පළමු පාර්ශ්වය*

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
නිමාව,
කොලොන්නාව.

*දෙවන පාර්ශ්වය*

අතර පැවති කාර්මික ආරාවුල

**ප්‍රදාන පත්‍රයේ දෝෂ නිවැරදි කිරීම.**

2024 මාර්තු මස 12 වැනි දින ප්‍රසිද්ධ කරන ලද අංක 2375/17 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ 10A පිටුවේ සඳහන්,

‘‘ ii (ඇ) ඉහත තනතුරුවල පිහිටුවීම මත ඉල්ලුම්කාරිය වෙත 2019 මාර්තු මාසයේ සිට 2020 පෙබරවාරි මාසය දක්වා හිඟ වැටුප් ලෙස රු. 249,960.00 ක් ද, 2020 මාර්තු මාසයේ සිට 2021 පෙබරවාරි මස දක්වා හිඟ වැටුප් ලෙස රු. 254,100.00 ක් ද, 2021 මාර්තු මාසයේ සිට 2022 පෙබරවාරි මාසය දක්වා හිඟ වැටුප් ලෙස රු. 320,680.00 ක් ලෙස ද, 2022 මාර්තු මාසයේ සිට 2023 පෙබරවාරි මාසය දක්වා හිඟ වැටුප ලෙස රු. 327,840.00 ක් ද, 2023 මාර්තු මාසයේ සිට 2023 දෙසැම්බර් මාසය දක්වා රු. 277,500.00 ක් ද, වශයෙන් මුළු එකතුව ලෙස රු. දහහතර ලක්ෂ තිස් දහස් අසූව (රු. 1,430,080.00) ක මුදලක් ප්‍රදානය කරන ලෙස ද,

(ඉ) අදාළ මුදල මෙම නියෝගයේ දින සිට දින 30 කාලයක් තුළ එනම් 2024.02.15 හෝ එදිනට පෙර කම්කරු කොමසාරිස්වරයා වෙත තැන්පත් කරන ලෙසත් ’’

යන කරුණු

‘‘ ii (ඇ) ඉහත තනතුරුවල පිහිටුවීම මත ඉල්ලුම්කාරිය වෙත 2019 අගෝස්තු මාසයේ සිට 2020 පෙබරවාරි මාසය දක්වා හිඟ වැටුප් ලෙස රු. 133,043.23 ක් ද, 2020 මාර්තු මාසයේ සිට 2021 පෙබරවාරි මස දක්වා හිඟ වැටුප් ලෙස රු. 264,670.00 ක් ද, 2021 මාර්තු මාසයේ සිට 2022 පෙබරවාරි මාසය දක්වා හිඟ වැටුප් ලෙස රු. 314,180.00 ක් ලෙස ද, 2022 මාර්තු මාසයේ සිට 2023 පෙබරවාරි මාසය දක්වා හිඟ වැටුප ලෙස රු. 319,340.00 ක් ද, 2023 මාර්තු මාසයේ සිට 2023 දෙසැම්බර් මාසය දක්වා රු. 269,000.00 ක් ද, වශයෙන් මුළු එකතුව ලෙස රු. දහතුන් ලක්ෂ දෙසිය තිස්තුනයි සත විසිතුන (රු. 1,300,233.23) ක මුදලක් ප්‍රදානය කරන ලෙස ද,

(ඉ) අදාළ මුදල මෙම ප්‍රදානය ගැසට් ගත වී මසක් ඇතුළත මැද කොළඹ සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත තැන්පත් කරන ලෙසත් ’’

ආකාරයෙන් සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වමි.
තව ද, එම ප්‍රදානයේ ඇතුළත් අනෙකුත් කරුණුවල වෙනසක් නොමැති බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

**බිනර ඒ. ගුණසේකර,**
බේරුම්කරු.

2024 ඔක්තෝබර් මස 29 වැනි දින
බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

EOG 11 - 0184

මගේ අංකය: IR/COM/03/2020/267.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2375/36 දරන හා 2024.03.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් මාතලේ, අළුවිහාරය, කුඹුරු කොටුව පාර, නදී සෙවණ, අංක 45/2 ලිපිනයෙහි පදිංචි පී.බෝයගොඩ මහතා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 34 ලිපිනයෙහි පිහිටි ජාතික නිවාස සංවර්ධක අධිකාරිය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A/58/2023 දරන හා 2023.12.30 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් පී. බෝයගොඩ මහතා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A/58/2023 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2025.03.14 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 නොවැම්බර් මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

**පළමුවන උපලේඛනය**

**"අ" ආකෘති පත්‍රය**

**(3වන නියෝගය)**

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත

**බේරුම්කරුවෙකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : පී. බෝයගොඩ, අංක 45/2, "නදීසෙවන"
කුඹුරුකොටුව පාර, අළුවිහාරය, මාතලේ.

දිනය : 2024.09.30

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2023.10.24 දිනැති අංක 2355/25 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ පී. බෝයගොඩ බැඳී සිටින්නාවූ ද 2023.12.30 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන

පිටපත : (*අනෙක් පාර්ශ්වය*)

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්ති බලන්න)

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන්ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුරද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 11 - 0185

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.